තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

# පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි එදිරිව. අධ්‍යාපන අමාත්‍යාංශය

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/**174/2021** (2021.07.19 වන දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යපටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සාමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක:** පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි
**නොතිසි ලත් පාර්ශවය:** නම්කළ නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය

**පෙනීසිටීම**
මෙය පාර්ශවයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.12.23 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - 2019.12.27 |
| නම් කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2020.01.07 |
| නම් කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය | අභියාචනය ලැබුණු බව දැන්වීම - 2020.01.14 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2020.02.24 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.12.23 වන දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

1. *අධ්‍යාපන ලේකම්ගේ ED/05/91/01/01/16 හා 2019.03..... දිනැති ලිපියෙන් මා කැඳවා කරනු ලැබූ මූලික විමර්ශනයේ වාර්තාව හා නිර්දේශ.*
2. *එම විමර්ශනයේ පැමිණිලිකරු හා ඊට අදාළ ලිපි ලේඛන*
3. *මෙම විමර්ශනයට ප්‍රකාශ ලබාදුන් සියලුම දෙනාගේ ප්‍රකාශවල ඡායා පිටපත්.*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.01.07 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී.

නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.02.24 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

කොමිෂන් සභා කාර්යාලය විසින් අභියාචනා විභාගය පිලිබඳ විධිමත් දැන්වීම් යැවීමෙන් පසු, පොදු අධිකාරිය විසින් අභියාචකටද පිටපත් සහිතව 2021.06.09 වන දිනැති ලිපිය මගින් වෙනත් කරුණු අතර පහත සඳහන් ලිඛිත කරුණු කොමිෂන් සභාව වෙත දන්වා සිටි.

*"4.ඉල්ලුම්කරුගේ තොරතුරු ඉල්ලීම, තොරතුරු නිලධාරියාගේ අංක ED/05/RTI01/04/01 හා 2020.02.25 දිනැතිව, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(උ) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කර ඇත.*

*6.අභියාචනාකරු විසින් පොදු අධිකාරිය තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බව පවසමින්, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව අදාල තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.*

*I. පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි ගුරු මාරු මණ්ඩලයේ වෘත්තිය සමිති නියෝජිතයෙකු ලෙස කටයුතු කරන හිමිනමකි. මෙම හිමිනම 2018 වසරේදී ගුරු මාරුවක් සම්බන්ධයෙන් අල්ලස් මුදලක් ලබා ගත්තායැයි සඳහන් පැමිණිල්ලකට අනුව අධ්‍යාපන අමාත්‍යංශය මගින් විමර්ශනයක් සිදු කර එම වාර්තාව 2019.10.29 දින ලබා දී ඇත.*

*II. මෙම විමර්ශනයේ දී අදාල සිද්ධියට සම්බන්ධ ගුරුවරුන් කිහිප දෙනෙකුගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති අතර, මෙම ගුරුවරුන් ජාතික පාසල් වල සේවය කරන ගුරුවරුන්වේ. පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි ජාතික පාසල් වල ගුරු ස්ථාන මාරුවීම් වලට අදාල ගුරු මාරු මණ්ඩලයේ වෘත්තිය සමිති නියෝජිතයෙකු ලෙස වර්තමානයේ දී ද කටයුතු කරන බැවින්, විමර්ශනය සඳහා ප්‍රකාශ ලබාදුන් සාක්ෂිකරුවන්ගේ නම් හා තොරතුරු අනාවරණය වුවහොත් අදාල ප්‍රකාශකරුවන්ට ඉදිරියේ දී යම් අගතියක් සිදු විය හැකි බව නිරීක්ෂණය කරමි. ප්‍රකාශකරුගේ අනන්‍යතාවය හා රහසිගත බව මෙමගින් ගිලිහු යනු ඇත.*

*එබැවින් මෙම අදාල විමර්ශන වාර්තාව ලබා දීම තුලින් සාක්ෂිකරුවන්ට යම් බලපෑමක් සිදු විය හැකි බැවින් විමර්ශන වාර්තාවේ නිර්දේශ පමණක් ඉදිරිපත් කරමි.*

*7.අභියාචනාකරු විසින් ඉල්ලා ඇති විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ නිගමන නිර්දේශ සහිත වාර්තාව ලබා දීම, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(උ) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන බව දන්වා සිටිමි."*

පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රතිචාර වශයෙන් 2020.07.09 වන දිනැති ලිපිය මගින් අභියාචක විසින් කොමිෂන් සභාව වෙත දන්වා සිටියේ *"අදාල විමර්ශනය පිළිබඳ සවිස්තර වාර්තාවක් තමා වෙත ලබා දෙන"* ලෙසයි.

ඒ අනුව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමේ අයිතම 1 සඳහා නිර්දේශ පමණක් 2021.06.09 වන දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

**නියෝගය:**

මෙහිදී අභියාචක විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීමේ කුමන අයිතමයන්ට අදාල තොරතුරු ලබා දීම හරහා, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5(උ) වගන්තියෙහි දැක්වෙන ව්‍යතිරේකයට අයත් වන්නේ කෙසේද යන්න පිළිබඳව සාධාරණ ප්‍රතිවිරුද්ධතාවක් මතු වන බැවින් පනතේ 5(උ) වගන්තියෙහි දැක්වෙන ව්‍යතිරේකයට අයත් වන්නේ

කෙසේද යන්න පිළිබඳව පොදු අධිකාරියේ ස්ථාවරය හා සාධාරණීකරණය කොමිෂන් සභාවට දැන්වීමට පොදු අධිකාරියට මින් නියෝග කර සිටී.

ඒ අනුව, මෙම අභියාචනය පුද්ගලික වශයෙන් කැඳවා විභාගකිරීමට කොමිෂන් සභාව තීරණය කරන අතර මෙය 2021.08.30 වන දින පෙ.ව. 10.15 ට කල්තබනු ලැබේ. මේ සඳහා දෙපාර්ශවයේම පැමිණීම අනිවාර්ය වන බව කොමිෂන් සභාව විසින් අවධාරණය කර සිටී.

ඒ අනුව අභියාචනය කල් තබනු ලැබේ.
මීළඟ දිනය - **2021.08.30 වන දින පෙ.ව. 10.15**

---

COVID-19 හේතුවෙන් රට තුළ පවතින තත්වය හේතු කොට ගෙන, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්ය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා ඉදිරි දිනයකට කල් දමන ලදී.

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම) /174/**2021** (2022.01.19 වන දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යපටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සාමාජික:** | විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම |
| **කොමිෂන් සභා සාමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ ජගත් ලියන ආරච්චි |

| | |
|---|---|
| **අභියාචක** | - පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි |
| **නොතිසි ලත් පාර්ශවය** | - නම්කළ නිලධාරි - අධ්‍යාපන අමාත්‍යාංශය |

**පෙනීසිටීම**

| | |
|---|---|
| අභියාචක | - පූජ්‍ය යල්වෙල පඤ්ඤාසේකර හිමි |
| පොදු අධිකාරිය | - පැමිණ නැත. |

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා අභියාචක පැමිණ ඇති බවත් පොදු අධිකාරි වෙනුවෙන් කිසිදු නියෝජනයක් නොමැති බවත්, පොදු අධිකාරිය විසින් 2022.01.13 දිනැති ලිපිය (email ) මගින් "තොරතුරු නිලධාරිවරිය නිවෙස් නිරෝධායනයට යොමු කර ඇති බැවින් වෙනත් දිනයක් ලබා දෙන ලෙස" කොමිෂන් සභාව වෙත දන්වා සිටින ලද බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

අද දින පැවති අභියාචන විභාගයේදී අභියාචක විසින් ප්‍රකාශ කර සිටින ලද්දේ, 2019.12.23 වන දිනැති තොරතුරු ඉල්ලීම සඳහා පොදු අධිකාරිය විසින් ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වී ඇති බවයි.

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ තොරතුරු ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියා කටයුතු කර නොමැති බවයි. ඒ අනුව තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) වගන්තියේ සඳහන් පරිදි *"ඉල්ලීමක් ලැබීමේදී එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයෙකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතුය"* යන්න හ 25(1) වගන්තියේ සඳහන් පරිදි *"තොරතුරු නිලධරයෙකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වූවද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබී දින 14ක් ඇතුළත...... ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර එම තීරණය ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතුය"* යන සිය ව්‍යවස්ථාපිත වගකීම සිදුකර නොමැති බවයි.

එසේම නම්කළ නිලධාරියාද පනතේ 31(2) වගන්තිය අනුව එනම් *"නම්කළ නිලධරයා විසින් ඕනෑම අවස්ථාවකදී එසේ වූවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී කුවිතාන්සියක් නිකුත් කළ යුතුය"* හා 31(3) වගන්තියේ සඳහන් පරිදි *"නම්කළ නිලධාරියා විසින් (1) වන උප වගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර ඒ සඳහා නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු දැක්විය යුතුය"* යන සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බව නිරීක්ෂණය කර සිටී.

**නියෝගය:**

පෙර සිදු කරන ලද නියමයන්ට අනුව 2021.07.19 දිනැති නියෝගයට අවනත වීමට පොදු අධිකාරියට තරයේ නියෝග කරන බව කොමිෂන් සභාව අවධාරණය කර සිටී.

පොදු අධිකාරියක සන්තකයේ , භාරයේ හෝ පාලනයේ පවතින ඉල්ලා සිටින තොරතුරුවලට, පුරවැසියෙකුගේ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි වන්නේ, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) වගන්තියේ සඳහන් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් සඳහන් කිරීම මගින් පමණක් බව අවධාරණය කරනු ලැබේ.මෙම අවස්ථාවේදී ඉල්ලා සිටින ලද මූලික විමර්ශන වාර්තා 5 වගන්තියේ කවර හෝ ව්‍යතිරේඛයකට අයත් නොවන නොවන බව අවධාරණය කරනු ලැබේ .

තවද, අභියාචක ඉල්ලා ඇති තොරතුරු ඉල්ලීමෙහි අයිතම 1, 2 සහ 3 සඳහා, පනතේ 3 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියෙහි භාරයේ, සන්තකයේ හෝ පාලනයේ පවතින එකී තොරතුරු අභියාචක වෙත 07.02.2022 දිනට පෙර, කොමිෂන් සභාවටද පිටපත් සහිතව වහාම ලබා දිය යුතු බවට පොදු අධිකාරිය වෙත මෙයින් නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභාවේ නියෝගයකට අවනත නොවීම පනතෙහි 39 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව දඬුවම් ලැබිය හැකි වරදක් බව පොදු අධිකාරියෙහි අවධානයට ලක් කරනු ලැබේ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 (1) (ඉ) වගන්තිය මගින් සඳහන් වන්නේ;

> "කොමිෂන් සභාවේ තීරණයකට අනුකූල වීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන.... සෑම තැනැත්තෙකුම මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් පනස්දහසක්

නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාර ගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා වරදකරු විය යුතුය."

ඒ අනුව, කොමිෂන් සභාව ලබා දුන් තීරණය සමඟ අනුකූලවීමට ප්‍රමාද වීමකින් තොරව හැකි ඉක්මණින් අවශ්‍ය පියවර ගන්නා ලෙසත් එසේ නොවන්නේ නම් පනතේ 39(4) වගන්තියේ විධිවිධාන අනුව පියවර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කරනු ලැබේ.

තවද, අභියාචක හට අදාළ තොරතුරු ලැබීමෙන් අනතුරුව සැහීමකට පත් නොවන්නේ නම් 07.02.2022 දින සිට මාසයක් ඇතුලත කොමිෂන් සභාවට දැන්වීමට නියෝග කරනු ලැබේ.

ඉහත නියෝගයන්ට යටත්ව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.